Article 13 (1).

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019-05-23

පැමිණිලි පාර්ශවය :- වෙනුර ප්‍රදීප් හෙට්ටිගමගේ මයා,
නො. 71, මහානාගපුර,
අම්පාර.

වගඋත්තර පාර්ශවය :-

1. පොලිස් පරීක්ෂක කේ. ධර්මසිරි පෙරේරා මහතා
පොලිස් ස්ථානය
වැලිගෙපොල.

2. පොලිස් සැරයන් 24156 කේ.ඒ.එච්. ජයසුන්දර මහතා
පොලිස් මුරපොල
මහානාගපුර.

3. පොලිස් කොස්තාපල් 39937 ආර්.එම්. චන්ද්‍රරත්න මහතා
පොලිස් ස්ථානය
බොරළ්ල.

<u>පැමිණිලි අංකය :- **HRC/AM/05/14**</u>

**පැමිණිල්ලේ සැලකිරීම :-**

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා දමන ප්‍රාදේශීය සභාවේ උප සභාපති ලෙස කටයුතු කළ බවත්, පසුව කෘෂි කාර්මික කටයුතුවල නිරත වී නීත්‍යානුකූල ලෙස ජීවත්වන අතර, 2013.11.13 දින තම නිවසට කිලෝමීටර් දෙකකටත් වඩා දුරින් පිහිටි නිවසක තිබූ දැව තොගයක් පල්ලව්වේන පොලිස් මුරපොලේ නිළධාරින්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

විසින් සොයා ගෙන ඇති බවත් එම දැව කේ.පි. දිනපාල යන අයකුගේ බවට හා ඒවා දෙමළ පුද්ගලයින්ගෙන් මිලට ගත් බවට එම අය විසින් පිළිගෙන තිබියදීත් පොලිස් නිලධාරින් අදාල දැව තොගයට කිසිදු සම්බන්ධතාවයක් නෙමැති මෙන්ම එම දැව තොගය තමාගේ බවට කිසිදු පිළිගත හැකි සාක්ෂියක් නොතිබියදි 2013.11.14 දින පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස දන්වා එහි ගිය විට තමා අත්අඩංගුවට ගෙන අනවසර දැව තබාගත් බවට චෝදනා නගා අධිකරණය වෙත ඉදිරිපත් කළ බවයි. එසේම ඒ සමගම තම මිතුරකු වන මංජුල කුමාර යන අයද එම වරදටම අත්අඩංගුවට ගත් බවද සඳහන් කරඇත.

මින් පෙර අවස්ථාවකදී තමාට දමන ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීම පවත්වන අවස්ථාවක වී.ඩී. ප්‍රේමදාස නැමැති අය විසින් මරණ තර්ජන කිරිමක් සම්බන්ධයෙන් තමා විසින් දමන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සම්බන්ධව කිසිදු පියවරක් නොගැනීම මත තමා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, අම්පාර වෙත ඒ පිළිබඳව දැන්වීම මත එහි ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ධර්මසිරි පෙරේරා මහතා තමා සමඟ වෛරයකින් පසුවූ බව තවදුරටත් සඳහන් කර ඇත.

එසේම ප්‍රාදේශීය සභාවේ සභාපති සමඟ පොලිස් ස්ථානාධිපති ධර්මසිරි පෙරේරා මහතා දැඩි හිතවත්කමකින් කටයුතු කරන අතර තමා සභාපතිගේ ක්‍රියා කලාපයට විරුද්ධව කටයුතු කිරීම මතද තමා සමඟ ඔහු අමනාපයෙන් පසුවූ බවත්, එසේම ගල්කොරි හිමියන්, වැලි බලපත්‍රලාභීන් හා ගවයන් ප්‍රවාහනය කරන්නන් සමඟ ස්ථානාධිපති සමීප සබඳතා පවත්වන අතර එම වැරදි ක්‍රියා කලාපය පිළිබඳව තමා ස්ථානාධිපති දැනුවත් කිරිම කිරීම මතද ඔහු සමඟ අමනාපයෙන් පසුවන බවත් එසේම දමන පොලිස් ස්ථානයේ නිලධාරින්ගේ දූෂණ හා අක්‍රමිකතාවලට එරෙහිව කටයුතු කිරීම මතද ස්ථානාධිපති තමන් සමඟ අමනාපයකින් පසුවන බවත් එම අමනාපකම් හේතුවෙන් අසත්‍ය චෝදනාවක් නඟා තමා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති බවටත් කරුණු දක්වා ඇත.

වගඋත්තර පාර්ශවයේ සැලකිරිම :-

පොලිස් ස්ථානාධිපති දමන, කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුට එරෙහිව 2013.11.14 වන දින දමන පොලිස් බලප්‍රදේශයේ පල්ලන්ඔය පොලිස් මුරපොලට අනුයුක්තව රාජකාරි කරන පොලිස් සැරයන් 24156 ජයසුන්දර ඇතුලු නිලධාරින් කණ්ඩායමක් විසින් කරන ලද බල පත්‍රයක් නොමැතිව මුද්‍රා නොකරන ලද ඉරන දැව කැබලි 71 ක් ලඟ

තබා ගැනිම යන චෝදනාව සම්බන්ධයෙන් අම්පාර ම/උබි 629/13 යටතේ අම්පාර ගරු මහේස්ත්‍රාත් අධිකරණයට 2013.11.15 වන දින කරුණු වාර්තා කර ඇති බවයි.

මෙම වැටලීම සිදුකළ 2013.11.14 දින දැව කැබලි 71 සමඟ 09 ඇල පොකුරුගම මහානාගපුර පදිංචි කේ.පි.දිනපාල යන අය අත්අඩංගුවට ගත් බවත් වෙනුර ප්‍රදීප් හෙට්ටිගමගේ හා මංජුල කුමාර යන අය වරදට සම්බන්ධවී සිටි (නඩුවට අදාල දැව භාණ්ඩ ලී කැබලි 71 සන්තකය කරමින් සිට) එම ස්ථානයෙන් බැහැර ගොස් ඇති බවට වැටලීම් කළ නිළධාරියා විසින් නිරීක්ෂණය කර සටහන් යෙදීම සිදුකර ඇති බවත් ඒ අනුව වරදක් කර එම ස්ථානයෙන් මඟ හැරගිය වෙනුර ප්‍රදීප් හෙට්ටිගමගේ හා මංජුල කුමාරට වැටලීම් කල දිනම පොලිස් ස්ථානයට පැමිණීමට දැන්වීම සිදුකළ බවත් සඳහන් කර ඇත.

ඒ අනුව 2013/11/15 වනදින මෙම දෙදෙනා දමන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් වීමෙන් පසුව එදින පැය 10.45 ට බලපත්‍රයක් නොමැතිව මුද්‍රා නොකරන ලද දැව ලඟ තබාගැනීමේ වරදට වරද කියාදී පොලිස් කොස්තාපල් 39937 රත්නායක නිළධාරියා විසින් අත්අඩංගුවට ගෙන ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් අනතුරුව එදින පැය 11.45 ට ඉහත නඩු අංක ම/උබි 629/13 යටතේ අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත් වගඋත්තර පාර්ශවය දන්වා ඇත.

පැමිණිල්ලේ සඳහන් කරන ආකාරයෙන් පැය 06.00 ක කාලයක් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයේ රඳවා තබා ගැනීමක් නොකල බවද තවදුරටත් දක්වා ඇත.

වගඋත්තර පාර්ශවීය පොලිස් කොස්තාපල් 39937 ආර්.එම්. චන්ද්‍රරත්න රත්නායක යන අය කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදෙමින් 2013/11/15 වන දින පොලිස් ස්ථානයේදි වෙනුර ප්‍රදීප් හෙට්ටිගමගේ හා මංජුල කුමාර යන අය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත ඉදිරිපත් වීමෙන් අනතුරුව පෙ.ව. 10.45 ට බලපත්‍රයක් නොමැතිව ඉරන ලද දැව කොටස් 71 ක් ලඟ තබාගැනීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන උපසේවයට භාරදුන් බව සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවීය පොලිස් සැරයන් 24156 කේ.ඒ.එච්. ජයසුන්දර යන අය කොමිෂන් සභාව වෙත 2014/01/27 වන දින ප්‍රකාශයක් ලබාදෙමින් 2013/11/13 වන දින තමා සේවය කළ පොලිස් මුරපොල වෙත ලැබුණු 119 පණිවුඩයට අදාළව ඉරන ලද දැව තොගයක් බලපත්‍ර නොමැතිව ලඟ තබාගැනීමේ වරදට 18 ඒ ජනපදය, 08 ඇළ මහානාගපුර පදිංචි කේ.ජී. දිනපාල යන අය අත්අඩංගුවට ගෙන දැව සමඟ සැකකරු දමන පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බව සඳහන් කර ඇත. කේ.ජී. දිනපාල යන අය හැර වෙනත් කෙනෙකු තමන් අත්අඩංගුවට නොගත් බවද දක්වා ඇත.

උක්ත පැමිණිල්ලේ විමර්ශන කටයුතු අධිකරණ නඩු කටයුතු හේතුවෙන් බහා තැබීම සිදුකර ඇති අතර නැවත පැමිණිල්ල විසින් තමන් නඩුවෙන් නිදොස් කොට නිදහස් කරන ලද බවට හා ඒ අනුව තමන් නීතිවිරෝධීව අත්අඩංගුවට ගැනීම පිළිබඳව පරීක්ෂණයක් කර තීරණයක් ලබාදීමට කටයුතු කරන ලෙසට කරන ලද ඉල්ලීමට අනුව නැවත පැමිණිල්ලේ විමර්ශන කටයුතු ආරම්භ කිරීම සිදු කර ඇත.

**විමර්ශණයේදි අනාවරණය වී ඇති කරුණු :-**

2013/11/14 වන දින 119 පණිවුඩය අනුව පල්ලවේවන පොලිස් මුරපොල ස්ථානාධිපති ලෙස කටයුතු කළ පොලිස් සැරයන් 24156 කේ.ඒ ජයසුන්දර ඇතුලු නිළධාරින් පිරිසක් විසින් ඉරණ ලද දැව තොගයක් බල පත්‍රයක් නොමැතිව ලඟ තබා ගැනීමේ වරදට 18 ඒ ජනපදයේ 8 ඇල මහානාගපුර පදිංචි එම්. දිනපාල යන අය අත්අඩංගුවට ගෙන ඇති බව අනාවරණය වේ.

අදාළ දැව තොගය අත්අඩංගුවට ගැනීමට යාමේදි වෙනුර ප්‍රදීප් යන අය හා මංජුල නැමැති යන අය එහි සිටි බව පොලිස් සැරයන් කේ.ඒ.එම්. ජයසුන්දර මහතාගේ නිරීක්ෂණ සටහන් වල ඇතුළත්ව ඇති අතර, අත්අඩංගුවට ගත් ඉරණ ලද මුද්‍රා නොතැබූ දැව කැබලි 71 ක් තමා විසින් දෙමළ යායේ පදිංචි සන්මුගම් නැමැති අයගෙන් මිලදී ගත් බවත්, එම දැව තොගය තමාගේ බවටත් කේ.පී. දිනපාල යන අය පොලිස් ස්ථානය වෙත ප්‍රකාශයක් ලබාදී ඇති අතර, අධිකරණයේදි ඔහු වරද පිළිගෙන දඩ මුදල් ද ගෙවා ඇති බවද අනාවරණය වේ.

2013/11/14 වන දින අදාළ ලී තොගය හා සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර, එදිනම වෙනුර ප්‍රදීප් (පැමිණිලිකරු) හට පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙස දැන්වීම් කර 2013/11/15 වන දින පොලිස් ස්ථානයට පැමිණි විට ඔහු බලපත්‍ර නොමැතිව මුද්‍රා නොකරන ලද දැව ලඟ තබා ගැනීමේ චෝදනාවට අත්අඩංගුවට ගැනීම සිදුව ඇති බවද අනාවරණය වේ.

2017/10/23 දිනැතිව පොලිස් පරීක්ෂක කේ. ධර්මසිරි මහතා කොමිෂන් සභාව වෙත ලබාදී ඇති වාර්තාවේ අත්අඩංගුවට ගත් දැව තොගය වෙනුර ප්‍රදීප් හෙට්ටිගමගේ යන අයගේ බවට සැක කරන බවටත්, ඔහු දැව තිබූ ස්ථානයේ සිටි බවටත් මහානාගපුර පදිංචි ඒ.බී. ප්‍රේමදාස මහතා විසින් ප්‍රකාශයක් ලබාදී ඇති බව සඳහන් කර ඇතත්, කොමිෂන් සභාව වෙත සිද්ධියට අළව ලබාදි ඇති පොලිස් උධෘත වලට අනුව ඒ.බී. ප්‍රේමදාස මහතා එවැනි ප්‍රකාශයක් ලබාදී ඇති බව අනාවරණය නොවේ.

අදාළ දැව තොගය හා කේ.පී. දිනපාල යන සැකකරු 2013/11/14 වන දින පැය 15.00 ට අත්අඩංගුවට ගෙන පැය 21.30 ට පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇති අතර, වෙනුර ප්‍රගීත් හෙට්ටිගමගේ යන අය 2013/11/15 වන දින පැය 10.45 ට අත්අඩංගුවට ගෙන ඇති බව අනාවරණය වේ.

මේ අනුව බලපත්‍රයක් නොමැතිව මාදං, තේක්ක, තෙළඹ, කැටකෑල වර්ගයට අයත් රු. 81,941,41 ක් වටිනා ඉරන ලද දැව කැබලි 71 ක් තම සන්තකයේ තබා ගනිමින් කැලෑ අඥා පනතේ 40 වන වගන්තිය සමඟ කියවෙන 2009 අංක 65 දරණ කැලෑ (සංශෝධන) පනතේ 23 වගන්තිය සමඟ කියවෙන 36(2) වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකළ බවට පැමිණිලිකරුට එරෙහිව චෝදනා ගොනු කිරීමට තරම් සාධාරණ සාක්ෂි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත්ව නොමැති බව අනාවරණය වේ.

නඩු අංක 61176/5 යටතේ අම්පාර දිසා මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු විභාගයේ තීන්දු ප්‍රකාශනයේ, මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වරදක් කර තිබිය යුතු බවත්, පැමිණිල්ල (පොලිස් ස්ථානය) ඒ සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කිරීමට අසමත්ව ඇති බවත්, පැමිණිල්ල විසින් නිසි විමර්ශනයක් සිදුකර නොමැති බවත් සඳහන් කර ඇති බව අනාවරණය වේ. එසේම එම සියලු කරුණු සලකා වෙනුර ප්‍රදීප් හෙට්ටිගමගේ මහතා චෝදනාවෙන් නිදොස් කොට නිදහස් කර ඇති බවද අනාවරණය වේ.

පැමිණිලිකාර වෙනුර ප්‍රගීත් හෙට්ටිගමගේ මහතා අත්අඩංගුවට ගැනීමට පැහැදිලි සාධාරණ හේතුවක් අනාවරණය නොවන අතර, එහිදී නිසි විමර්ශනයක් සිදුකර නැති බව ඉදිරිපත් කර ඇති පොලිස් උඩෘත හා වගඋත්තර පාර්ශවයේ නිළධාරීන් ගේ ප්‍රකාශ අනුව අනාවරණය වේ.

දමන ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් කටයුතු කර ඇති පැමිණිලිකරු ප්‍රදේශයේ ජනප්‍රිය පුද්ගලයකු වන අතර, ඔහු පො.ප. කේ. ධර්මසේන පෙරේරා මහතාට එරෙහිව යම් යම් සිදුවීම් පිළිබඳව පොලිස් අධිකාරි කාර්යාලය වෙත සිදුකල පැමිණිලි හේතුවෙන් ඔහු සමඟ තිබූ අමනාපය මත මෙම අත්අඩංගුවට ගැනීම හා නඩු පැවරීම් කටයුතු සිදුකර ඇති බව ඉදිරිපත්ව ඇති කරුණු නිරික්ෂණය කිරීමේදී හැඟී යයි.

**නිරීක්ෂණ :-**

ඉහත සියලු කරුණු අනුව හිටපු දමන පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ. ධර්මසිරි පෙරේරා මහතා විසින් එම්.ජී. වෙනුර ප්‍රදීප් හෙට්ටිගේ යන අය අත්අඩංගුවට ගැනීම නිසි විමර්ශනයකින් තොරව

සිදුකර ඇති බව අනාවරණය වේ. විශේෂයෙන්ම අත්අඩංගුවට ගැනීමට අදාළ බලපත්‍ර නොමැති හා මුද්‍රා නොකරන ලද දැව තොගය පැමිණිලිකරුගේ බවට කිසිදු සාක්ෂියකින් අනාවරණය වී නොතිබියදී හා දැව තමාගේ බවට පුද්ගලයකු ඉදිරිපත්ව සිටියදී අදාළ ස්ථානයේ සිටිය බවට පොලිස් සැරයන් ජයසුන්දර මහතා යොදා තිබූ සටහන පමණක් පදනම් කරගෙන මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

එසේ සිදු කිරීම තුල පැමිණිලි පාර්ශවයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම වගඋත්තර පාර්ශවීය පො.ප කේ.ධර්මසිරි පෙරේරා මහතා විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

දෙවන වගඋත්තර පාර්ශවය ලෙස නම් කර ඇති පොලිස් සැරයන් ජයසුන්දර මහතා පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධයක් නොමැති බව අනාවරණය වන අතර පොලිස් කොස්තාපල් 39937 රත්නායක යන අයද ස්ථානාධිපතිවරයාගේ නියෝග අනුව පොලිස් ස්ථානයේදී අදාළ පුද්ගලයා අත්අඩංගුවට ගැනීම පමණක් සිදුකර ඇති බවද අනාවරණය වේ.

නිර්දේශය :-

1. නීති විරෝධිව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පැමිණිලිකරුට වූ හානිය වෙනුවෙන් පොලිස් පරීක්ෂක ධර්මසිරි මහතා විසින් රු. 10,000/- ක වන්දි මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතුය.

2. වගඋත්තර පාර්ශවයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශයේ පිටපතක් පොලිස්පතිවරයා වෙත, නීතිපතිවරයා වෙත, සහ පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කරන බවද දන්වා සිටිමු.

2019. 06 . 21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. පොලිස්පතිතුමා,
   පොලිස් මූලස්ථානය, කොළඹ 01.

2. නීතිපතිතුමා,
   නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12.

3. අධ්‍යක්ෂ,
   ජාතික පොලිස් කොමිෂන් සභාව,
   බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
   කොළඹ 08.

සැ:යු - අදාල මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

B/ R-4